# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,564 — 1958 ඔක්තෝබර් 24 වැනි සිකුරාද — 24.10.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස – ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 1565 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් | | ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ. 57/58 /ඇල් ජී 228 ; ආර්/කිව්. 210

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :—

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරික සීමාවතුළ දෙමටගොඩ කොට්ඨාශයේ පිහිටි කොලොන්නාව පාරේ වරිපනම් අංක 190/14 සිට 18, 190/20, 190/24, 190/94 සහ 190/103 (කොටස) සහ ඥාණවිමල පාරේ වරිපනම් අංක 76 හා 76/1 සිට 7 දරණ ඉඩම්වලින් අ. 3, රූ. 3, පා. 18ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට : කොලොන්නාව පාරේ වරිපනම් අංක 176, 178, 180, 182, 188, 190, 190/9, 196, 198, 198/2, 202, 204, 206, 208, 216, 218, 220, සහ 220/1 දරණ ඉඩම් ;

නැගෙනහිරට : ඥාණවිමල පාර සහ ඒ 3148 මුලික සැලැස්මෙහි 2 සහ 3 කැබලි සහ ඒ 3149 මුලික සැලැස්මෙහි 2 වෙනි කැබැල්ල (රජය) ;

දකුණට : පාලින පෙදෙසේ වරිපනම් අංක 75, දරණ ඉඩම, වරිපනම් අංක 51, 53, 57, 59, 61, 63, 65 (පාලිත පෙදෙස) සහ කොලොන්නාව පාරේ වරිපනම් අංක 190/103 කොටස දරණ ඉඩම සහ ඒ 3,835 මුලික සැලැස්මෙහි 1 වෙනි කැබැල්ල ;

බස්නාහිරට : කොලොන්නාව පාරේ වරිපනම් අංක 166, 166/36, 166/14, 166/15 සිට 21, 190/71 සිට 75 සහ 196/103 දරණ ඉඩම.

1958ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1565—ජේ. ඇන්. බී 7825—930 (10/58)

E 1

අංකය : ජේ 57 ටී 366,ආර්/කිව් 184.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

1. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ, කොළොන්නාව පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 6, 6/1, සිට 6/16 දරණ ඉඩමෙන් අ. 2, රූ.2, පා. 17ක් විශාල කැබැල්ලට මායිම :—

උතුරට : දුම්රිය පාරට ඉතිරිකළ හරිය (16,710 මූලික සැලැස්මෙහි 74 වෙනි කැබැල්ල),
නැගෙනහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ 14 දරණ ඉඩම්,
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 6/16, 6/17, 6, 6/316, 6/316 ඒ සිට 309 ඊ දරණ ඉඩම්වල කොටසක්,
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරිකැබැල්ල.

2. කොළඹ දියාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම්නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොලොන්නාව පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 6/16, 6/17, 6, 6/316, 6/316, ඒ. 309 ඒ සිට 309 ඊ, දරණ ඉඩම්වලින් අ, 0, රූ, 2, පා. 34ක් පමණ විශාල කැබැල්ලට්මායිම් :—

උතුරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 6, 6/1, සිට 6/16 දරණ ඉඩම්වල කොටස,
නැගෙනහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ 14 දරණ ඉඩම්වල කොටස,
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කැබලි.

3. කොළඹ දියාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ 14 දරණ ඉඩම්වලින් අ. 2 රූ. 2 පා. 39ක් පමණ විශාල කැබැල්ලට මායිම :—

උතුරට : දුම්රිය පාරට ඉතිරිකළ හරිය, (16710 මූලික සැලැස්මෙහි 75 වෙනි කැබැල්ල) සහ ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 1 දරණ ඉඩමේ කොටස,
දකුණට : මෙම ඉඩමේම ඉතිරි කැබලි සහ ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 10 දරණ ඉඩමේ කොටස,
නැගෙනහිරට : කරත්තපාර සහ ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 1 දරණ ඉඩමේ කොටස,
බස්නාහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 6, 6/1 සිට 6/16, 6/17, 6, 6/316, 6/316ඒ, 309ඒ සිට 309 ඊ දරණ ඉඩම්වල කොටස්.

4. කොළඹ දියාවේ කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ, කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ අංක 7 කොට්ඨාශයේ වේරගොඩගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 1 දරණ ඉඩමෙන් අ. 0, රූ. 3, පා. 18ක් පමණ විශාල කැබැල්ලට මායිම් ;—

උතුරට ; දුම්රිය පාරට ඉතිරිකළ හරිය (16,710 මූලික සැලැස්මෙහි 76 වෙනි කැබැල්ල),
නැගෙනහිරට : කරත්තපාර,
දකුණට සහ බස්නාහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ 14 දරණ ඉඩම්වල කොටස්.

5. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 3/2 දරණ ඉඩමෙන් අ.0, රූ.0, පා.34ක් පමණ විශාල කැබැල්ලට මායිම ;—

උතුරට : දුම්රිය පාරට ඉතිරිකළ හරිය, (16710 මූලික සැලැස්මෙහි 76 වෙනි කැබැල්ල),
නැගෙනහිරට : දුම්රිය පාරට ඉතිරිකළ හරිය, (17,204 මූලික සැලැස්මෙහි 1 වෙනි කැබැල්ල),
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 3, 3/1, දරණ ඉඩම්වල කොටස,
බස්නාහිරට : කරත්තපාර.

6. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 12 දරණ ඉඩමෙන් අ. 1, රූ. 0, පා. 02ක් පමණ විශාල කැබැල්ලට මායිම :—

උතුරට : දුම්රිය පාරට ඉතිරි කළ හරිය (17041 මූලික සැලැස්මෙහි 1 වෙනි කැබැල්ල හා 17,204 මූලික සැලැස්මෙහි 2 වෙනි කැබැල්ල),
නැගෙනහිරට : අලුත්පාර සහ ඉතිරිකළ හරිය (ඒ.1327 මූලික සැලැස්මෙහි 4වෙනි කැබැල්ල),
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 7, 7/1, සිට 7/12 දරණ ඉඩම්වල කොටස,
බස්නාහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 3, 3/1 දරණ ඉඩමේ කොටස.

7. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගම ගම පිහිටි ගෙරදෙහි පිටියේ වරිපනම් අංක 3, 3/1 දරණ ඉඩමෙන් අ. 3, රූ. 0, පා. 4ක් පමණ විශාල කැබැල්ලට මායිම :—

උතුරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 3/2, සහ 12 දරණ ඉඩම්වල කොටස්,
නැගෙනහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 12 දරණ ඉඩමේ කොටස සහ ඉතිරිකළ හරිය (ඒ.1,327 මූලික සැලැස්මෙහි 4 වෙනි කැබැල්ල),
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 5, 5/1 සිට 5/12 දරණ ඉඩමේ කොටස,
බස්නාහිරට : කරත්තපාර.

8. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 10 දරණ ඉඩමෙන් අ. 0, රූ. 2, පා. 24ක් පමණ විශාල කැබැල්ලට මායිම :—

උතුරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ 14 දරණ ඉඩමේ කොටස,
නැගෙනහිරට : කරත්ත පාර,
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 12 දරණ ඉඩමේ කොටස,
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කැබැල්ල සහ ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 14, 16, 16බී දරණ ඉඩම්වල කොටස.

9. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 12 දරණ ඉඩමෙන් අ.1 රූ.0 පා.7ක් පමණ විශාල කැබැල්ලට මායිම :—

උතුරට ; ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 10 දරණ ඉඩමේ කොටස,
නැගෙනහිරට : කරත්තපාර,
දකුණට සහ බස්නාහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 14, 16, 16බී දරණ ඉඩම්වල කොටස.

10. කොළඹ දියාවේ, කොළඹ ප්‍රාදේශිය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොලොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වේරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 14,16,16බී දරණ ඉඩමෙන් අ.1, රූ.2, පා.04ක් පමණ විශාල කැබැල්ලට මායිම ;—

උතුරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 12 දරණ ඉඩමේ කැබැල්ල,
නැගෙනහිරට : කරත්ත පාර,
දකුණට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 7, 7/1 සිට 7/12 දරණ ඉඩමේ කැබැල්ල,
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කැබැල්ල.

11. කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොලොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වෙරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 5, 5/1 සිට 5/12 දරණ ඉඩමෙන් අ. 1, රූ. 0, පා. 38ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 3, 3/1 දරණ ඉඩමේ කැබැල්ල,
දකුණට : අලුත්පාර සහ ඉතිරිකළ හරිය (ඒ. 1,327 මූලික සැලැස්මෙහි 5වෙනි කැබැල්ල),
බස්නාහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 7, 7/1 සිට 7/12 දරණ ඉඩමෙ කැබැල්ල.

12. කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොලොන්නාවේ පළාත් ආණ්ඩු සහා සීමාවතුළ සේදවත්තේ අංක 7 කොට්ඨාශයේ වෙරගොඩ ගම පිහිටි ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 7, 7/1 සිට 7/12 දරණ ඉඩමෙන් අ. 3, රූ. 3, පා. 19ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 14, 16 සහ 16බී දරණ ඉඩම්වල කැබැල්ල,
නැගෙනහිරට : ගෙරදෙහිපිටියේ වරිපනම් අංක 5, 5/1 සිට 5/12 දරණ ඉඩම්වල කැබැල්ල,
දකුණට : අලුත්පාර සහ ඉතිරිකළ හරිය (ඒ. 1,327 මූලික සැලැස්මේ 6වෙනි කැබැල්ල),
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කැබැල්ල.

1958 ක්වූ අගෝස්තු මස 22 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

ඇල්එච්/ඒ.1005.

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි ;

කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්යොදුන් කෝරලයේ, මගුරුමස්විල පිහිටි, අක්කර 0, රූඩ 1, පර්චස් 24ක් පමණ ප්‍රමාණය ඇති තේක්කගහවත්තේ ඕවිට හා ඒදන්ඩගාවඕවිට නමැති ඉඩම් කැබලි 3ට මායිම් :—

(1) තේක්කගහවත්තඕවිට : ප්‍රමාණය පර්චස් 05.5ක් පමණ.

උතුරට හා දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස් (මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 29ඒ හා 29බී) ;
නැගෙනහිරට : ඒදණ්ඩගාවඕවිට නම් ඉඩම. (මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 6) ;
බටහිරට : මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 29.

(2) ඒදණ්ඩගාවඕවිට : ප්‍රමාණය පර්චස් 34ක් පමණ.

උතුරට හා දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස් (මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 6) ;
නැගෙනහිරට : මගුරුමස්විල දෙල ;
බටහිරට : ඩබ්. කේ. ඇන්. අප්පු හා තවත් අයට අයත් තේක්කගහවත්තඕවිට නම් ඉඩම (මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 29ඒ).

(3) ඒදන්ඩගාවවත්ත : ප්‍රමාණය පර්චස් 25ක් පමණ.

උතුරට හා දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස් (මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 6) ;
නැගෙනහිරට : මුල් ගම් සැලැස්ම නො. 95 කැබලි නො. 27 ;
බටහිරට : මගුරුමස්විල දෙල.

අංකය : ජේ57/58 ඇල් 169/ඇල්එච්/ඒ.1005.

1958ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ වෙරගම ගමමුළාදැනි වසමෙහි වෙරගම පිහිටි ගහේයාය නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ 1, පර්චස් 30ක් පමණ වූ මෙහි පහත මායිම් සඳහන් ඉඩම් කොටස :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස;
නැගෙනහිරට : මහවැලි ගඟ;
දකුණට : පාලම සඳහා එම ඉඩමෙන් රජය ලබාගත් ඉඩම (අංක 301 දරණ ග්‍රාමීය සැලැස්මේ කැබලි අංක 79);
බස්නාහිරට : ප්‍රසිද්ධ පාර.

සඳහන් අංකය : ජේ57/58 වී 434—ඇල්ඩී/ඊ/7.

1958 සැප්තැම්බර් මස 24 දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

අංකය : ජේ. 57. එල් ජී 77. එල් බී 2314.

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දික්වැල්ල උතුර ගමේ පිහිටි පෝටාව නොහොත් ජූලාන කුඹුර නැමැති ඉඩමෙන් 114′ × 12′ ක කැබැල්ලක්. ඊට මායිම් :—

උතුරට : දික්වැල්ලේ දෙන් කරෝලිස් අබේනායක විසින් හිමිකම් කියන කරගහකුඹුර නමැති ඉඩම ;
නැගෙනහිරට : අඩි පාර, ඇළ සහ දික්වැල්ලේ වැවුරුකන්නල ඩෝරා එමලිනා චන්ද්‍රවතී මුතුකුමාරණ විසින් හිමිකම් කියන ගිගනගෙවත්ත නමැති ඉඩම;
දකුණට : මහවෙල්ල;
බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

1958ක්වූ සැප්තැම්බර් මස 9 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නාබවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව ආදායම් නිලධාරි කොටසේ, තිහගොඩ–කපුදූව ගම්මුලාදැනි වසමේ, කපුදූවේ පිහිටි, තච්චක්කඩ කුරුඳුවත්ත නමැති ඉඩමෙන් අක්කර 2 ක පමණ කොටසක්; ඊට මායිම්:—

උතුරට : අලුත්වත්ත සහ වෙල්ලාලගෙවත්ත නමැති ඉඩම්;
නැගෙනහිරට : අලුත්වත්ත, වෙල්ලාලගෙවත්ත සහ පන්සල්වත්ත නමැති ඉඩම්;
දකුණට : කපුදූව–කඩවැද්දුව බී. ආර්. සී. පාර;
බටහිරට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල.

අංකය : එල්. බී. 2356 /ජේ 57 /58 ඊ 293.

1958 ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම හා ඉඩම සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බස්නාහිර ගිරුවා පත්තුවේ, බටහිර කුඩාවැල්ල ගම් මුලාදැනි කොට්ඨාශයේ , කුඩාවැල්ල හෙවත් කුඩාවැල්ලකැලේ ගමේ පිහිටි, අක්කරයක් පමණ වන (303 අ. ග. සිතියමේ ලොට් 14 ඇන් දරන) තනිගහහේන නමැති සම්පූර්ණ ඉඩම. ඊට මායිම් :—

උතුරට : අඩිපාර හෝ පරන කරත්ත පාර,
නැගෙනහිරට : කොකුහෙන්නදිගේ දෙන් දියස් ද සිල්වා මහත්මයා අයිතිවාසිකම් කියන ඉඩම,
දකුණට : මුහුදු වෙරල,
බස්නාහිරට : ලොකුයද්දෙහිගෙ පොඩිසිංඤෝ මහත්මයා අයිතිකම් කියන ඉඩම.

අංකය : ජේ. 57/58 ඊ 418/ඇල් ඩී 7637.

1958ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම හා ඉඩම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතක

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බස්නාහිර ගිරුවා පත්තුවේ පුවක්දණ්ඩාව ගමේ පිහිටි පුංචියාය පංගුව හෙවත් පනික්කියා පංගුව, පොල්කොරටුවේ දෙනිය, ලන්සියාගම, පහළකුඹුර, අම්පිටිය වැව සහ කෝපිවත්ත නමැති සාමාන්‍යයෙන් අක්කර 14, රූ. 3, ප. 02 බිම් කරමින් යුත් ඉඩම් කට්ටි 8 කි.

(1) පුංචියාය පංගුව හෙවත් පනික්කියා සංගුව : (සාමාන්‍ය) අ. 1, රූ. 0, ප. 28.

උතුරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට 37;
නැගෙනහිරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 37 සහ අම්පිටිය වැව ;
දකුණට සහ බස්නාහිරට: 308 අ.ග.සි. 17 අතිරේකය ලොට 104.

(2) පොල් කොරටුවේ දෙනිය : (සාමාන්‍ය) අ. 0, රූ. 1, ප. 37.

උතුරට සහ නැගෙනහිරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 37 ;
දකුණට සහ බස්නාහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිවාසිකම් කියන අම්පිටිය වැව.

(3) ලන්සියාගම : (සාමාන්‍ය) අ. 1, රූ. 0, ප. 0.

උතුරට සහ බස්නාහිරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 104 ;
නැගෙනහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිවාසිකම් කියන අම්පිටියවැව ;
දකුණට : කේ. විපස්සි ස්වාමීන්වහන්සේ අයිතිවාසිකම් කියන පහළකුඹුර නමැති ඉඩම.

(4) පහළ කුඹුර : (සාමාන්‍ය) අ. 0, රූ. 1, ප. 02.

උතුරට : කේ. එච්. ප්‍රෙමරත්න සහ තවත් අය අයිතිකම් කියන ලන්සියාගම නමැති ඉඩම ;
නැගෙනහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන අම්පිටියවැව ;
දකුණට : කේ. ආරියපාල අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ;
බස්නාහිරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 104.

(5) පහළකුඹුර : (සාමාන්‍ය) අ. 0, රූ. 0, ප. 31.

උතුරට : කේ. විපස්සි ස්වාමීන්වහන්සේ අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ;
නැගෙනහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන අම්පිටියවැව ;
දකුණට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන අම්පිටිය වැව සහ 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 104;
බස්නාහිරට : 308 අ.ග.සි. 17 අතිරේකය ලොට් 104.

(6) අම්පිටිය වැව : (සාමාන්‍ය) අ. 11, රූ. 2, ප. 18.

උතුරට : 308 අ.ග.සි. 17 අතිරේක 37, 94 සහ 105 දරණ කැබෙලි සහ ඇස්. හතරසිංහ සහ තවත් අය අයිතිකම් කියන පොල් කොරටුවේදෙනිය නමැති ඉඩම ;
නැගෙනහිරට : පාර ;
දකුණට : 308 අ.ග.සි. 17 අති. 124, 123, 105, 252, 125, 106 සහ 253 දරණ කැබෙලි ;
බස්නාහිරට : එච්. ඩී. සවුහාමි අයිතිවාසිකම් කියන පුංචියාය පංගුව හෙවත් පනික්කියා පංගුව නමැති ඉඩම, කේ. එච. ප්‍රෙමරත්න අයිතිකම් කියන ලන්සියාගම නමැති ඉඩම, කේ. විපස්සි හිමියන් සහ තවත් අය අයිතිකම් කියන පහලකුඹුර නමැති ඉඩම සහ 308 අ.ග.සි. 17 අතිරේක ලොට් 104.

(7) කෝපිවත්ත : (සාමාන්‍ය) අ. 0, රූ. 0, ප. 04.

උතුරට සහ නැගෙනහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන අම්පිටියවැව ;
දකුණට : 308 අ.ග.සි. 17 අතිරේක ලොට් 125 ;
බස්නාහිරට : 308 අ.ග.සි. 17 අතිරේක ලොට් 105.

(8) කෝපිවත්ත : (සාමාන්‍ය) අ. 0, රූ. 0, ප. 02.

උතුරට සහ නැගෙනහිරට : ඇල්. එච්. සයිමන් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන අම්පිටියවැව ;
දකුණට සහ බස්නාහිරට : 308 අ.ග.සි. 17 අතිරේක ලොට් 106.

අංකය : ජේ 56 ඇල් 311/ඇල්.ඩී. 7475.

කොළඹ, 20.8. 1958.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

---

## 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමෙ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුළු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදයම් පාලක නිලධාරි කොඨාශයට අයත් රිල්පොල කෝරළයෙහි වැදිගුණේ නැමැති ගමේ පිහිටි ගලහිටියාවත්ත සහ ගලහිටියාව යන ඉඩම් කැබැලි දෙකින් සංයුක්තවූ අංක 170වේ අන්තිම ගම් සිතියමේ අතිරේක අංක 10යෙන් දක්වෙන 157 හා 158 යන කැබලිවලින් මැන බෙද වෙන් කරන ලද ඉඩම් අක්. 0, රූඩ් 3 යි, පර්. 04·3ක් සඳහා දැන්වීමයි.

1958ක්වූ සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹදිය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ඇල් ඇල් ඒ 6218.

## 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් ආඥපනත අනුව සංශොධනය කළ පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තිය යටතේ ඉඩම හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ කිරිඇල්ල පලාතේ කිරිඇල්ල නමැති ගමේ පිහිටි අංක 182 දරන අවසාන ගම සිතියමේ ලොට් 136 කොටයේ දෙහිගහකන්ද කුඹුර නමැති ඉඩමෙන් පර්චස් 11·4ක ප්‍රමාණයක්, මායිම් පහත දක්වේ:—

උතුරට : කිරිඇල්ල මහඇල;
නැගෙනහිරට : කිරිඇල්ල මහඇල සහ එම ඉඩමේ ඉතුරු කොටස ;
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතුරු කොටස්.

ජේ 57/58 ඇල් 221 හා සම්බන්ධයි.

1958.19.9. කොළඹ.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම් සහ පනාවල් දෙකෝරළේ ප්‍රාදේශිය ආදායම් නිලධාරී තැනගේ කොටසට අයත් කොස්ගහකන්ද වසමේ හත්කැලේ ගමේ පිහිටා තිබෙන සහ අංක 534 දරන අවසාන ගම් සිතියමේ බිම් කට්ටි අංක 42 සේ මැන වෙන්කොට තිබෙන නැන්නේවත්ත නැමති ඉඩමෙන් අක්කර 2ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : හත්කැලේ-මියනවිට පාර ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස (අංක 534 දරන අවසාන ගම් සිතියමේ බිම් කට්ටි අංක 42);
දකුණට : අංක 534 දරන අවසාන ගම් සිතියමේ බිම් කට්ටි අංක 172 සහ 173 ;
බස්නාහිරට : අංක 534 දරන අවසාන ගම් සිතියමේ බිම් කට්ටි අංක 58 සහ හත්කැලේ-මියනවිට පාර.

අංකය : ජේ57/58 ඊ191/එල්.එම්.5719.

1958ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කල පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කල පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියමේ නො . ඒ 4,200 ගම : ගොඩගම

| කැබැල්ල | ඉඩමේ නම | විස්තරය | අයිතිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලගහ කුඹුර ... | කුඹුර ... | කස්තුරි ආරච්චිගේ ජේමිස් සිංඤෝ, ගොඩගම; කස්තුරි ආරච්චිගේ සුබසිංහ, අලවල පාසැල, අලවල; අදිකාරි ආරච්චිගේ අබිලින් නෝනා, දඹුවුව; එදිරිසිංහ තෝමස් සිංඤෝ, ගොඩගම; මුහන්දිරම් ඩී. පී. රාජකරුණා, මිල්ලතේ; වීරක්කොඩි පතිරන ලාගේ චාර්ලිස් සිංඤෝ, ගොඩගම සහ ඇස්. ඒ. ඩී. යයිමන් සිංඤෝ, වලලියැද්ද | 0 0 15·7 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 ක්වූ දෙසැම්බර් මස 18 වැනි දින පෙරවරු 10 යේ වේලාවට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 ක්වූ දෙසැම්බර් මස 4 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වර්ෂ 1958 ක්වූ ඔක්තෝම්බර් මස 17 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩබලන අතිරේක උප ඒජන්තතුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ නො. ඒ 4,229. ගම: පාදුක්ක

| කැබැල්ල | ඉඩමේ නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාදන්ගහලන්ද ... | අවුරුදු 30ක පොල්ගස් 11ක් ඇති පොල් ඉඩම | ඇම්. ඩී.බී. ජයවර්ධන, නො. 9, මුවර් පාර, වැල්ල වත්ත | 0 0 14·7 |
| 2 | එම ... | අවුරුදු 20–40ක පොල්ගස් 215ක් ඇති පොල් ඉඩම | එම ... ... | 3 0 03·2 |
| | | | එකතුව ... | 3 0 17·9 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හෝ අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන්, 1958 දෙසැම්බර් මස 16 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 දෙසැම්බර් මස 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින්-දැනුම්දිය යුතුයි.

අංකය : කියු.බී.280/ජේ57ඊ252.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 17 දින,
කොළඹ කච්චේරියේදීය.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩබලන අතිරේක උප ඒජන්ත තැන.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කළ පරිදි, 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : ඇල් එච්/ඩීජ් 481.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

පිහිටීම.—කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ නාගොඩ නමැති ගම—කැබලි 1, 2 සහ 3, මූලික සැලැස්ම නො. ඒ 4220.

| කැබලි නො. | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | කොට්ටම්බගහකැලේ වත්ත ... | අවුරුදු 40ක් වයසැති රබර් වැවිල්ල ... | ජී. ඇන්. ඊ. ද සිල්වා, නෝටන් සහ සමාගම, ග්‍රාන්ඩ්පාස්, කොළඹ | 1 1 35.4 |
| 2. | එම ... | අවුරුදු 35 ක් වයසැති රබර් වැවිල්ල, හේනකින් යුක්ත වේ | ඇස්. ඒ. චාර්ලිස් අප්පුහාමි, කටුකුරුන්ද, කළුතර | 3 3 12·6 |
| 3. | වනමීගහළඩුමුල්ල ... | එළිමහන් මුඩු බිම—යුද හමුදාව නැවති සිටින, ගරා වැටුනු ගොඩනැගිලි | බ්‍රියට්ස් අබේකෝන් මහත්මිය, වලව්ව, අගලවත්ත; හෙලිනා පෙරේරා මමිය. සහ නිමල් පෙරේරා මයා, නො. 90, කොලිජ් වීදිය, කොටහේන | 0 2 28·8 |
| | | | එකතුව ... | 5 3 36·8 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 ක්වූ දෙසැම්බර් 23 වැනි දින පූ.භා. 10 ට කළුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 ක්වූ දෙසැම්බර් 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

1958 ක්වූ ඔක්තෝබර් 20 වැනි දින,
කළුතර කච්චේරිය.

ජේ. වී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරනු ලැබූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 2 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංක : ඇල්. ඩී/4994.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කුළුගම්මන සිය පත්තුවේ, මලගම්මන ගමෙහි පිහිටි උඩපන්නලවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 21·3 වූ, මූලික සිතියම් අංක ඒ 2546, කැබලි අංක 1 යනුවෙන් මැන විස්තර කරන ලද, දැනට ඩී. එච්. ජයවික්‍රම (ලිපිනය :—විලියම් සහෝදරයෝ, තිරිකුණාමල වීදිය, මහනුවර) විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම් කොටස.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ දෙසැම්බර් මස 2 වෙනි දින පෙරවරු 10ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958වේ නොවැම්බර් මස 25 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් ඉල්ලනු ලබන වන්දි ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලි ද මෙ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 15 දින,
මහනුවර කච්චේරියේදිය.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

## 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංක : ඇල්. ඩී/4992

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ පස්බාගේ කෝරළේ කඩියන්ලෙන ගමෙහි පිහිටි, ප්‍රමාණයෙන් අ.2,රූ.1,ප.15·7 වූ කඩියන්ලෙනවත්ත නමැති, මූලික සැලැස්ම ඒ.2544රේ කැබලි අංක 1 යනුවෙන් මැන විස්තර කරන ලද, දැනට, සීමා සහිත කඩියන්ලෙන තේවතු සමාගම, (කොළඹ, තැ.පෙ. නො. 65, සීමාසහිත ගෝඩන් ෆ්‍රේසර් සහ සමාගම) විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම් කොටස.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ නොවැම්බර් මස 28 වෙනි දින පෙරවරු 11ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958වේ නොවැම්බර් මස 21 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුමදිය යුතුයි.

තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් ඉල්ලනු ලබන වන්දි ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මෙ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 14 දින,
මහනුවර කච්චේරියේදිය.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වේනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල් ඩී 4951.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරණලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර—

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම් පාලක කොට්ඨාශයේ ගන්දහය උතුරු කෝරළේ, උඩුවෙල උඩගම පිහිටි මුල් ප්ලෑන් නො. ඒ 2540 ලොට් නො. 1 සිට 11 දක්වා මැන විස්තර කරන ලද ලුනුවැල්ල වත්ත.

| ලොට් නො. | | අයිතිවාසිකම් කියන අයගේ නම් | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 සහ 11 | ... | මහනුවර අස්ගිරිය විහාරේ ගරු යටවත්තේ ශ්‍රී ධම්මරතන මහනායක ස්ථවිරයන් වහන්සේ ... ... | 11 2 04 |
| 2 | ... | මහනුවර අස්ගිරිය විහාරේ ගරු අඹගස්වැවේ රතනපාල ස්ථවිරයන් වහන්සේ සහ මොරගොල්ල ගමේ තලපිටිය විහාරේ ගරු කේ. ධම්මානන්ද ස්ථවිරයන්වහන්සේ | 5 2 09 |
| 3 | ... | කොළඹ නොරිස් වීදියේ, පරම විඥනාර්ථ සමිතිය ... ... ... ... | 6 0 27 |
| 4 සහ 6 | ... | උඩුවෙල උඩගම පන්ගොල්ලේගෙදර පිතා ... ... ... ... ... | 5 2 36 |
| 5 සහ 10 | ... | මහනුවර අස්ගිරිය විහාරේ ගරු ඇන්. සුමන ස්ථවිරයන් වහන්සේ ... ... ... ... | 5 2 16 |
| 7 | ... | උඩුවෙල උඩගම ඩබ්ලිව්. බබියාගේ උරුමක්කාරයන්වන උක්කු අම්මා සහ ප්‍රෙමදාස, ඩබ්ලිව්. ජේමිස් වීරසිරි, ඩබ්ලිව්. උක්කු අම්මා, ඩබ්ලිව්. සුමනාවතී, ඩබ්ලිව්. මාටින්, ඩබ්ලිව්. සරණතුංග, ඩබ්ලිව්. සීලාවතී, ඩබ්ලිව්. නන්දවතී, සහ ඩබ්ලිව්. සෝමාවතී | 0 3 35 |
| 8 | ... | මොරගොල්ලාගම, තලාව විහාරේ භාරකාර මාරස්සන, තලාව විහාරේ ගරු අඹන්වෙල් සුමන්ගල ස්ථවිරයන් වහන්සේ ... | 2 1 20 |
| 9 | ... | මොරගොල්ලගම, තලදපිටිය විහාරේ ගරු. කේ. ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ ... ... ... | 4 1 21 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස 2 වන දින පස්වරු 3ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 නොවැම්බර් මස 26 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

තවද එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියළු ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

1958ක්වූ ඔක්තෝබර් මස 14 වන දින,
මහනුවර කච්චේරියේ දීය.

ඊ. එම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා

---

## නිවැරදිකිරීම

අංකය : ඇල් ඩී 7576/ජේ. 56 ඇල් 518/වී.ඊ.

1958 ජනවාරි 3 වන දින සහ නො. 11,230 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ, 1954 අංක 39 දරණ (සංශෝධිත) ඉඩම් අත්පත්කර ගැනීමේ ආඥපනතින් සංශෝධනයවූ 1950 අංක 9 දරණ ඉඩම් අත්පත්කරගැනීමේ ආඥපනතේ 5 ඡෙදය යටතේ ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් නිකුත්කළ නො. ජේ 56 ඇල් 518 (වීඊ) සහ 1957.11.28 දතමින් යුත් ප්‍රකාශනයෙහි මෙහි පහත සඳහන් තොරතුරු වෙනස් කරන ලදී—

(අ) '' උතුරට : 3 වෝපෝ සිතියමේ 11 අතුරු සිතියමේ ලොට් 123 සහ වෙලගාවබැද්ද හෙවත් පලුගොඩබැද්ද '' යනුවෙන් කියවෙන ලෙස 12 පේලියේ '' සහ '' යන වචනයට පසුව ඇති '' බද '' සහ 13 පේලියේ '' ගිරිය වැව '' යන වචන එකතුව '' බදගිරියවැව '' යන වචන අස්කර ඒ වෙනුවට '' වෙලගාවබැද්ද හෙවත් පලුගොඩබැද්ද '' කියා යොදනු.

(ආ) '' බස්නාහිරට : වෙලගාවබැද්ද '' යන්නෙන් කියවෙන ලෙස 16 පේලියේ '' බදගිරිය වැව '' යන වචන දෙක අස්කොට ඒ වෙනුවට '' වෙලගාවබැද්ද '' කියා යොදනු.

1958 ඔක්තෝබර් 18 දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

වී. සිවඥනම්,
හම්බන්තොට දිසාපති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්. ආර්. 1569.

පොදු කටයුත්තක් සඳහා පහත දක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමෙ ආඥපණතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි

රජයට ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර : වත්තේවැව ගමේ ප්‍රාරම්භක ගම් පිඹුරේ 143ඒ

| ලොට් | ඉඩමේ නම | | විස්තර | | හිමිකම් කියන්නන්ගේ නම් | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 | නුග ගහ ඉඩම | ... | හේන | ... | රත්මල්ගහවැව, වත්තේවැව, අප්පුරාලගේ බණ්ඩා චන්ද්‍රසේකර රාජකරුණා මුදියන්සේලාගේ අප්පුහාමි, සිලම්බුරාලගේ ඡප්මවති, කිරිබණ්ඩාගේ රන්එතනි, කිරිබණ්ඩාගේ අවුසදහාමි, කිරිබණ්ඩාගේ හේරත්බණ්ඩා | 1 2 01·5 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 1958 නොවැම්බර් මස 14 වෙනි දින අපරභාග 2ට රත්මල්ගහවැව ගම්සභා උසාවියේදී මා හමුවිය යුතුයි.

තවද, 1958 නොවැම්බර් මස 7 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දනුම දිය යුතුයි.

අයිතිවාසිකම් සඳහා ඉදිරිපත් කරණ සියළු ඔප්පු ලියකියවිලි ආදියක් ඇතොත් ඒවා විභාග වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

1958.10.17 වෙනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දීය.

ඇන්. පී. ජෙගනාදන්,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ උප ඒජන්තතුමා.

# ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම්

අංකය : ඇල් ඒ/ජී/1566

## දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස ගාල්ලේ කච්චේරියේ ඉඩම් ශාඛාවේ දී 1958 නොවැම්බර් මස 5 වෙනි දින පූ. භා.10ට 1935හේ අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් ගාල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත තුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

### දීමට යන ඉඩමේ විස්තර

| පැලැනේ අංකය හා ගම | කැබෙල්ලේ අංකය | අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| ඕපාත—අ.ග.සැ. 491 | 200 | හීනිදුම ලියනගේ අයනේරිස් ගුණවර්ධන | 5 1 32 |
| ඕපාත—අ.ග.සැ. 491 | 208 සහ 212 | ධර්මදාස සමරවික්‍රම | 8 3 18 |
| වීරපාන—අ.ග.සැ. 492 | 141 | චාර්ල්ස් ඩයස් නාගහවත්ත | 13 0 26 |
| ගිගුම්මඩුව—අ.ග.සැ. 482 | 126 | හික්කඩුව ගලපතිගේ සර්නේලිස් සිල්වා | 10 0 20 |
| තලන්ගල්ල—අ.ග.සැ. 489 | 233 | මිහිඳුපාල ඩී. සෙනවිරත්න | 3 2 26 |
| එම | 230 | තවලම ගමගේ පියසේන | 4 2 30 |
| ඕපාත—අ.ග.සැ. 491 | 182 | වන්නිආරච්චි කන්කානම්ගේ පොඩිඅප්පුහාමි ගුණදාස | 5 1 20 |
| තලන්ගල්ල—අ.ග.සැ. 489 | 215 | පනන්ගල ලියනගේ පොඩිනෝනා | 4 1 13 |
| එප්පල—අ.ග.සැ. 525 | 195 | චාරිස් ජාලත්ගේ | 3 3 16 |
| එම | 186 | කොක්ගේ බබුන් අප්පු ආරියසේන | 5 0 19 |
| එම | 187 | කොක්ගේ එරානො අප්පු | 3 0 17 |

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ලව්ලේන්හි වෙළඳ කටයුතු සඳහා ඉඩම් බදු දීම

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලයේ නගර සීමාව තුල නුවර පාරේ පිහිටි, එකක ප්‍රමාණය පර්චස් 24ක් පමණවූ, රජයේ ඉඩම් කැබැලි දහයයක්, ඒවා වෙළඳ කටයුතුවලට ප්‍රයෝජනයට ගැනීම සඳහා, 1958 නොවැම්බර් මස 21 වැනි දින පෙ. ව. 10ට, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත (මෙයින් පසු ආණ්ඩුවේ ඒජන්ත තැනයයි සඳහන් කර ඇති)—තැන විසින් කච්චේරියේ '' නිස්න් හට් '' එකේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දන්වමි.

2. මෙම විකිණීම, විකුණන අවස්ථාව වනවිට, ත්‍රිකුණාමලයේ නගර සීමා ඇතුලත අවුරුදු 10ක් හෝ ඊට වඩා කාල සීමාවක් නොකඩවා පදිංචිව ඇති අයවලුන්ට පමණක් සීමා කරනු ලැබේ. විකිණීමට ඇතුල්වීම, එසේ පදිංචි ඇති බව ඔප්පුකරමින්, නගරය සහ කඩවත් කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබා ගන්නා ලද සහතික ඇති අයවලුන්ට පමණක් සීමා කරනු ලැබේ. යම් අයෙක් මෙම කරුණ ඉටුකිරීම හෝ නොකිරීම නිසා ඇතිවන යම්කිසි ආරවුලක් වෙතොත්, එම සම්බන්ධයෙන් ත්‍රිකුණාමල ආණ්ඩුවෙ ඒජන්ත තැනගේ තීරණය අවසාන තීරණය වන්නේය.

3. වෙන්දේසියේදී ඉල්ලුම්කළ යුත්තේ පළමුව තක්සේරු කරන ලද මුදලේ සිටය. එක් ඉඩම් කැබැල්ලකට ගෙවිය යුතු අඩුම මුදල් ගණන රුපියල් 15 කි. ගෙවීමට නියම කරනු ලබන පළමු තක්සේරු මුදලට අඩුවෙන් ඉල්ලීම් භාර ගනු නොලැබේ.

4. ඉල්ලීම් භාරගැනීමට මත්තෙන් දිසාපති තුමා විසින් ඉල්ලුම් කරන තැනැත්තාගේ ස්ථිර භාවය හා ඔහුට බදු කොන්දේසින් අනුව කටයුතු කළ හැකිද යනාදිය ගැන සළකා බලනු ලැබේ. ඒ ගැන එතුමා සතුටට පත් නොවන්නෙහි නම් ඉල්ලීම් සියල්ල ප්‍රතික්ෂෙප කර වෙන්දේසිය නැවත පටන් ගනු ලැබේ.

5. සෑම ඉල්ලුම් කරුවෙක්ම පුද්ගලිකව ඉහත සඳහන් ස්ථානයට හා එම වේලාවට පැමිණිය යුතුයි. නැතහොත්, ඔහු විසින් සහතික කොට පත්කරන ලද නියෝජිතයෙක් එවිය යුතුයි. වෙන්දේසියට කලින් පරීක්ෂා කර බැලීම සඳහා අවශ්‍ය ලියවිලි නියෝජිතයන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

6. සාර්ථකවූ සෑම අයදුම් කරුවෙක්ම—

(අ) ඔහුගේ ඉල්ලීම් බාරගත් විගසම, ඔහුගේ ඉල්ලීමේ මුළු මුදල හා අත්තිකාරම් සිට පළමු අවුරුද්දේ බද්ද ආණ්ඩුවේ ඒජන්ත තැනට ගෙවිය යුතුයි ;



(ආ) ඔහු වෙත බද්ද පවරා දින 14ක් තුල, බද්දේ වැඩ සම්පූර්ණ කළ යුතුයි.

ඉල්ලුම්කරු ඉහත සඳහන් (අ) හෝ (ආ) දරණ පරිච්ඡෙද වලට, කැමැත්ත දැක්වීමට අපොහොසත් වුවහොත්, ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් විකිණීම අවලංගු කිරීමට හා සාර්ථකවූ ඉල්ලුම්කරු විසින් ගෙවන ලද මුදල් රාජ සන්තක කිරීමට ඉඩ තිබේ.

7. සෑම බද්දක් සඳහා ම අනිකුත් කොන්දේසි ඇතුලුව පහත දැක්වෙන කොන්දේසි අඩංගු වේ :—

(අ) කාලය : අවුරුදු 99යි,

(ආ) බද්ද : අවුරුද්දට රුපියල් 25යි. මෙය සෑම අවුරුදු 30හකට වරක්ම ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් අලුතෙන් නියම කරනු ලැබේ. ඒ ආකාර අලුතෙන් නියම කරන විට, ඉහතින්වූ අවුරුදු 30හේ කාලය තුල ගෙවන ලද බදු මුදලට වඩා 50% වඩා අධික නොවිය යුතුයි,

(ඉ) බදුකරු විසින්, බද්ද ආරම්භ වී මාස හයක් ඇතුලත සහ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ සතුටට හේතුවන පරිදි, ඉඩමෙහි, ත්‍රිකුණාමල යෙහි නගර සභාවේ සභාපති තැන විසින් කලින් අනුමත කොට ඇති සැලැස්මවල් සහ විස්තරානුකූලව, ස්ථිර ගොඩනැගිලි තැනවිය යුතුයි. බදුකරු විසින් ආණ්ඩුවේ ඒජන්ත තැනගේ සහ ත්‍රිකුණාමලයේ නගර සභාවේ සභාපති තැනගෙන් කල් ඇතිව ලියවිල්ලකින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව මිස නැතුව, එහි ඇති ගොඩනැගිලි වලට අමතර කොටස් තැනවීම හෝ එම ගොඩනැගිලි වැඩිදියුණු කිරීම නොකළ යුතුයි,

(ඊ) බදුකරු විසින් ඉඩම් වෙළඳ කටයුතු සඳහා ස්ථානයකට මිස අන් කරුණක් සඳහා, ආණ්ඩුවේ ඒජන්ත තැනගෙන් කල් ඇතිව ලබා ගන්නා ලද ලියවිල්ලේ කැමැත්ත ඇතුව මිස නැතුව, ප්‍රයෝජනයට නොගත යුතුයි,

(උ) ඉඩම් හිමිකරුවූ බදු දෙන්නා වෙනුවෙන්, ඉඩම් කොමසාරිස් තැනගෙන් ලියවිල්ලකින් ලබා ගන්නා ලද කැමැත්ත නැතුව බදුකරු විසින් ඉඩම, වෙන අයෙකුට බදුදීම, පරිත්‍යාග කිරීම, උගස් කිරීම, පැවරීම හෝ වෙන ක්‍රමයකින් බද්දෙන් නිදහස් වීම හෝ බද්ද වෙනුවෙන් ඔහුගේ ඇති අයිතිවාසිකම් වෙන කෙනෙකුට දීම නොකළ යුතුයි,

(ඌ) බදුකරු විසින්, ඉඩමෙහි ඉදිකරන ලද යම් ගොඩ නැගිලි හොඳින් අලුත්වැඩියා කර තබා ගැනීම සහ ඉඩම වටේට ශක්තිමත් වැටක් හෝ තාප්පයක් සෑදිය යුතුයි,

(එ) බදුකරු විසින් ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වෙනුවෙන් අයවිය යුතු සියලුම බදු මුදල්, ආදායම් බදු සහ ගොඩනැගිලි වෙනුවෙන් අයවිය යුතු බදු මුදල් සහ වියදම් ගෙවිය යුතුයි,

(ඒ) බද්ද අවසානයේ දී හෝ බද්ද අවසාන කළ යුතු යයි කලින් තීන්දු කළහොත්, බදුකරු විසින් ඉඩමේ ඔහුට ඇති හිමිකම් අත හැර, ඉඩමේ සහ ගොඩනැගිලිවල අයිතිය, හොඳ තත්ත්වයෙන් ආණ්ඩුවේ ඒජන්ත තැනට හෝ ඔහු විසින් පත් කරන ලද යම් කිසි නිලධාරියෙකුට බාර දිය යුතුයි. (සාධාරණ පිරිහීම් ගැන සලකා බලනු ලැබේ),

(ක) ඉඩමෙහි ඉතිරිව ඇති යම් යම් ගොඩනැගිලි වෙනුවෙන් හෝ අතිකුත් දේවල් වෙනුවෙන් රජයෙන් වන්දියක් ඉල්ලීමට බදුකරුට අයිතිවාසිකමක් නැත.

7. බද්දේ වැඩිදුර විස්තර දනගැනීම සඳහා, ආණ්ඩුවේ ඒජන්ත තැනට ඉල්ලුම් පතක් එවිය යුතුයි.

ඒ. ආර්. මැක්හෙයිසර්,
ත්‍රිකුණාමලයේ ආණ්ඩුවේ ඒජන්ත තැන.

1958 ඔක්තෝබර් මස 6 වැනි දින,
ත්‍රිකුණාමල කච්චේරියේදීය.

---

අංකය ඇල්. ජේ: 1262

## 21 (2) දරණ ආණ්ඩුවේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

හලාවත ගරු රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින්, පුත්තලම් පාලක දිස්ත්‍රික්කයේ ආනවිලුන්දන් පත්තුවේ කටුපොත ජනපද ව්‍යාපාරයේ වූ රජයේ ඉඩම්වලින්, අක්කර 2ක් පමණ වූ බිම් කැබැල්ලක්, රෝමානු කතෝලික පල්ලියක් හා පූජක තුමන් සඳහා නිවාසයක්ද එහි ගොඩ නැගීම සඳහා බද්දට ඉල්ලා ඇති බව මෙයින් දනුම් දෙමි.

2. යෝජිත මෙම දේවස්ථානය පවුල් 78කට පමණ ප්‍රයෝජන වනු ඇත. ළඟම ඇති රෝමානු කතෝලික පල්ලිය පිහිටා ඇත්තේ මීට සැතපුම් 3ක් පමණ ඈතිනි. මේ කරුණ සඳහා ඉඩම දීමට ඇත. එසේම, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසි වලටද යටත්කොට, ඉල්ලීම අනුව ඉඩම බදු දීමට අදහස් කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 99යි,

(ආ) බදු මුදල අවුරුද්දකට රුපියල් 10යි,

(ඉ) බදුකරු විසින් බද්ද ආරම්භ වන දින සිට අවුරුදු 2ක් ඇතුලත දී, ඉඩමෙහි පල්ලි ගොඩනැගිල්ල සහ පූජක තුමන් සඳහා නිවාසය පුත්තලමේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉදි කළ යුතුයි,

(ඊ) බදුකරු විසින්, මෙම ඉඩම පල්ලියක් සහ පූජකතුමන්ගේ නිවාසයක් සඳහා මිස අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට, සති හය (6) ක් ඇතුලතදී, මෙම ඉඩම නොදිය යුතු බවට ලියවිල්ලකින් කරුණු මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.